# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: **13/2015 (i)**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017 ජනවාරි 09 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම්**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2015.09.18 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2015 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 2016.10.27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 (i) හි දී ඇති විධිවිධාන සලකා, ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2015හි 04 ඡේදයේ 03 කොටස පහත පරිදි සංශෝධනය කිරීමට 2016.12.15 දින පැවැති සිය 955වන සභා වාරයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

> “නිල වාහනයක් හිමි නිලධාරියෙකුට නිල වාහනය භාවිත කිරීම හෝ රු. 50,000/-ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගත හැකිය. කෙසේ වුවද, එවැනි නිලධාරීන්ට රියදුරකු හෝ රියදුරු දීමනාවක් ලබා දෙනු නොලැබේ.”

03. ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2015 හි අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතී.

04. ඉහත විධිවිධානය 2017.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති